State Ministry of Education Reforms, Promotion of Open Universities and Distance Learning

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය

# G.C.E. ORDINARY LEVEL - Rehearsal Question Paper

අ.පො.ස. සා/පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

(Sinhala)

සිංහල භාෂාව හා සාහිත්‍යය - III

# (QUESTION PAPER) - III

## ප්‍රශ්න පත්‍රය - III



අනුග්‍රහය :

NenasaTV

The National e-learning Portal for The General Education

**අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය**
**සිංහල භාෂාව හා සාහිත්‍යය - III**
**අ.පො.ස.(සා/පෙළ) - ආදර්ශ ප්‍රශ්න පත්‍රය**

| **11 ශ්‍රේණිය** | **කාලය පැය 1 යි** |
|---|---|

- **සැලකිය යුතුයි.**
- **උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **1,2,3,4 ප්‍රශ්නවලටත් 5,6,7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.**
- **මෙම පත්‍රයට හිමි ලකුණු ගණන 80 කි.**

1. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) පියසන් නො ව බිඟු දැල් රැඳි කොපුලී
.......................................................
.......................................................
ගජසෙන් සිතියම් ගජ සිරි කියෙලී

(අ)මෙම කවියේ ඉතිරි පද පේළි දෙක සම්පූර්ණ කරන්න.
(ආ) මෙහි ඇතුළත් සමූහාර්ථවාචී පද දෙකක් ලියන්න.

(ii) (අ)කෙළි සෙල්ලම් ආශ්‍රිත ව නිර්මාණය වූ ජනකවි ප්‍රභේද දෙකක් ලියන්න.
(ආ) දෙවියන් උදෙසා පුද පූජා පවත්වද්දී ජනයා යොදාගත් කවි වර්ග දෙකක් ලියන්න.

(iii)"ඉදින් නුඹ වහන්සේ අමුත්තක් දන්නා සේක් වී නම් පසිඳුව මැනව'යි කීහ."
(අ)මෙසේ පැවසුවේ කවු ද?
(ආ) කුරුණෑගල යුගයේ රචනා වූ බවට සැලකෙන පද්‍ය කාව්‍ය කෘතියක් නම් කරන්න.

(iv) (අ)ලෙනාඩ් වුල්ෆ් මහතා ශ්‍රී ලංකාවේ තම රාජකාරිය කළ දිස්ත්‍රික්ක දෙකක් නම් කරන්න.
(ආ)The Monkey(ද මන්කි), Savage Sanctuary(සැවේජ් සැන්චුවරි) යන කෘතිවල කතුවරුන් දෙදෙනා කවුරුන් ද?

(v)"රිසි නොවීද මා පියාට වාසෙ මාලිගේ"
(අ)මෙය කාගේ ප්‍රකාශයක් ද?
(ආ) එදිරිවීර සරච්චන්ද්‍ර මහතා පිදුම් ලැබූ සම්මාන දෙකක් නම් කරන්න.

(vi) (අ)එස්. මහින්ද හිමියන් මෙරට දී පැවිද්ද ලැබූ නිකාය දෙක නම් කරන්න.
(ආ)'ජාතික තොටිල්ල' පැදි පෙළ අයත් වන්නේ කුමන තේමාවක් යටතේ ලියන ලද කවි වර්ගයකට ද?

(vii) (අ)සිංහල කතා කලාවේ සංක්ෂිප්ත රීතිය නිරූපණය කරන කෘතිය කුමක් ද?
(ආ)මෙම කෘතිය රචනා වූ යුගය කුමක් ද?

(viii) (අ)සිංහල සාහිත්‍ය වංශයේ දැනට දක්නට ඇති පැරණිතම සන්දේශ කාව්‍ය කුමක් ද?
(ආ) එය රචනා වූයේ කුමන යුගයේ ද?

(ix) (අ)එච්. එම්. කුඩලිගම කවියා සේවය කළ පුවත්පත් දෙකක් නම් කරන්න.
(ආ) කොළඹ II කවි යුගය දීප්තිමත් කළ කවීන් දෙදෙනෙකු නම් කරන්න.

(x) (අ)සාමණේර භික්ෂූන් සඳහා වන විනය නීති සංග්‍රහ දෙකක් නම් කරන්න.
(ආ)'කාව්‍යාදර්ශ' නම් අලංකාර ග්‍රන්ථයේ සිංහල අනුවාද ග්‍රන්ථයේ නම කුමක් ද?

2.පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i)පවන' ද පිපි තුරේ ය නිර තුරේ ය
කුසුමන් පෙති තුරේ ය මළු තුරේ ය
අවට සුපිපි <u>සරේ ය</u> බිඟු <u>සරේ ය</u>
සිත එවෙහෙර කෙරේ ය ලොබ කෙරේ ය

(අ)ඉහත කවියේ ඉරි ඇඳි පදවල අර්ථ පිළිවෙළින් ලියන්න.
(ආ) සුන්දර වටපිටාව ගැන දක්වා ඇති අදහස එක් වාක්‍යයකින් ලියන්න.

(ii)"... මා උපන්තැන් පටන් - ගෙනැ දැනැ සතක්හු දිවි නො ගැලවී නම් ඒ සසින් තිටදු හබට දූ සෙත් වේව'යි සස් කරා'යි .."

(අ)මෙසේ පවසන්නේ කවු ද? කාහට ද?
(ආ) මෙය ඇසූ තැනැත්තා ගේ පිළිතුර වූයේ කුමක් ද?

(iii)රුති වන පෙතිනැවිදින් <u>සුමුවෝයා</u>
නිති මියුරැති වෙණ නද ළමුවෝයා
සිතුවිලි නැති රූ විලස මුවෝයා
තැති නොගනිති මිනිසුන් <u>සමුවෝයා</u>

(අ) ඉරි ඇඳි පදවල තේරුම් වෙන් වෙන් ව ලියන්න.
(ආ) වීණාවාදනයේ මිහිරියාව සමග සිදු වූ අපූර්වත්වය මෙම කවියේ දක්වා ඇති ආකාරය කෙටියෙන් දක්වන්න.

(iv)"... එහෙත් හය මසකට පමණ පසු යළිත් ඔහු ගෙදරට පාත් වූ කල ගැලවීගත හැකි වූයේ නොවදින වැඳුම් වැඳ, කෙසේ හෝ තව සති දෙකක්..."

(අ)මෙහි සඳහන් කරුණ කුමක්දැ'යි කෙටියෙන් දක්වන්න.
(ආ) මෙම නිලධාරියා මාස හයකට පසු පැමිණීම මගින් ඔහුගේ කවර ලක්ෂණයක් ඉස්මතු වේ ද?

(v)'මේ රජ්ජුරුවන්ට මා මුත් අනෙක් පිළිසරණක් නැති'

(අ)මෙසේ පැවසීමට පෙර මේ පිළිබඳව සඳහන් කළ උපමා දෙකක් ලියන්න.
(ආ) මහෞෂධ පඬිතුමා රජු හමු වී ඉන් පසු ගත් ක්‍රියාමාර්ගය කෙටියෙන් දක්වන්න.

3. සැළලිහිණි සන්දේශයෙන් උපුටාගත් **'මගවිසිතුරු'** පැදි පෙළෙන්
( i)ස්වභාව සෞන්දර්ය මැනවින් වර්ණනා කිරීම'
(ii) එකල සමාජ ආර්ථික තොරතුරු දැක්වීම මැනවින් සිදු වී ඇත' එක් කොටසකට කවි දෙක බැගින් යොදා ගනිමින් මේ බව විමසන්න.

**නැතහොත්**

- වඩා සාර්ථක නවකතාවක් නිර්මාණය කිරීමෙහි ලා කතුවරයා,
(i)සංවාද භාවිතය
(ii)සංකේත හා සංකල්ප රූප මැවෙන පරිදි බස හැසිරවීම දැකිය හැක. එක් කොටසකට උදාහරණ දෙක බැගින් දක්වමින් **'බැද්දේගම'** නවකතාවේ ඔබට නියමිත කොටසින් මේ බව විමසන්න.

4. **'ගංගාවේ සංගීතය'** පැදි පෙළෙහි,
(i)ගැඹුරු ජීවන දර්ශනයත් ගෙනහැර පෑම
(ii) විවිධ කාව්‍යෝපක්‍රම භාවිතය දැකිය හැක. එක් කොටසකට උදාහරණ දෙක බැගින් දක්වමින් මේ පිළිබඳ ව විමසන්න.

**නැතහොත්**

- ධර්මසේන හිමියෝ කතා කීමේ දක්ෂයෙකි.
(i)හාස්‍ය, අනුකම්පාව මතුවන පරිදි අවස්ථා නිරූපණය කිරීම,
(ii)අභියෝග ජය ගනිමින් අනාගතය ජය ගත හැකි බව පෙන්වීම **'උග්ගසේන සිටුපුත්තුගේ වස්තුව'** මගින් සිදුවේ.එක් කොටසකට උදාහරණ දෙක බැගින් දක්වමින් මේ බව විමසන්න.

5. **සිංහබාහු** නාට්‍යයේ, සිංහබාහුගේ චරිතයෙන් පිළිබිඹු වන්නේ නව යොවුන් වියේ තරුණයකුගේ හැසිරීම් ස්වරූපය යි. උදාහරණ අවස්ථා තුනක් යොදා ගනිමින් මේ පිළිබඳ විමසන්න.

6. ජන ජීවිතය වඩා යහපත් කිරීමට ජන කවියෙන් ලද හැකි පිටිවහල ඉතා විශාල ය. උදාහරණ කවි 3 ක් යොදාගනිමින් **'හානා හීය පානා අඩහැරෙන් දැනේ'** කවි පෙළෙන් මේ පිළිබඳව විමසන්න.

7. සිහින ලෝකය හා සැබෑ ලෝකය දෙකක් බව දක්වමින් පාඨකයා තුළට ජීවිතාවබෝධය ගෙනදීමට **'දියමන්ති මාලය'** කෙටි කතාවෙන් සුදුසු අවස්ථා තුනක් යොදා ගෙන මේ පිළිබඳව විමසන්න.